

# අපි කුමක් කරමුද ?






ලක්ෂ්මන් කොඩිතුවක්කු

යුද්ධයක් දිනා වසර හයක් ගත වූ අතීතයක් අපිට දැන් හිමිව ඇත. අපි යුද්ධ කළේ අපේම එවුන් සමඟය. එකම වෙනසකට තිබුණේ කතා කරන භාෂාව පමණි. අනෙක් හැම අතින්ම උතුරේත් දකුණේත් තැලෙන පෑගෙන පීඩිත ජනතාව හැමදාම දුක් වින්දහ. ඇති නැති පරතරයට හා සූරා කෑමට ජාති ආගම් භේද ප්‍රශ්ණයක් නැත. අප රටේ ඇති නැති පරතරය ඉතා විශාල වශයෙන් ඉහළ අගයක් ගන්නා විට එයට උතුරේත් දකුණේත් පීඩිත ජනතාවගේ කරපිට වැටුණේ සිංහල දෙමළ මුස්ලිම් භේද නොබලාය. රැකියා ප්‍රශ්ණයේදීත්, අධ්‍යපන හා සමාජයීය ප්‍රශ්නවලදීත් මේ හැන්දෙන්ම ගුටි බැට ලැබුණේ අසරණ අහිංසක ජනතාවටය. ඔවුන් සිංහල, මුස්ලිම්, දෙමළ සියල්ලම වේ. දෙමළාට ඇති ප්‍රශ්න සිංහලයාට ද තිබේ. සිංහලයාට ඇති ප්‍රශ්න දෙමළාට ද තිබේ. මේ දෙගොල්ලන්ටම ඇති ප්‍රශ්න මුස්ලිම්වරුන්ටද තිබේ. ධනපති පංතියට ජාති ආගම් භේද ප්‍රශ්නයක් නැත. එහෙත් පීඩිත පංතිය කොටවා එයින් වාසි ලබා ගැනීමට යොදන මූලික ක්‍රමයක් වන්නේ ජාති ආගම් භේදයයි.

විල්පත්තු වනයේ ඉඩම් බෙදා දුන්නේ මුස්ලිම් ජනතාවටය. විල්පත්තු වනයේ ඉඩම් හා එහි පදිංචියට ගිය ජනතාව දෙස බලනවිට ඔවුන්ද විල්පත්තු වනයේ ජීවත්වන අලි ඇතුන් මුවන් සේම අසරණය. දුගී දුප්පතුන් එය පසුගිය රජය සමයේ එම රජය සමඟ සිටි මුස්ලිම් ඇමතිවරයකුට ලැබුණු දායාදයකි. පසුගිය රජයේ ජනාධිපතිවරයා පරදින බැව් දැනගත් දැනගත් ඔහු අවසන් මොහොතේ යහපාලනයට පැන්නේය. වන සතුන්ට හිමි වනයේ ඉඩම් ඔහු ලබාගත්තේ දේශපාලන වාසි සඳහාය. නැත්නම් අලි ඇතුන් ගැවසෙන වතුර බිඳක් නැති මෙවැනි කැලයකට තමුන්ගේ ජනයා පදිංචි කිරීමට තරම් ඔහුට හිතක් පපුවක් ඇතිවූයේ අනාගත ඡන්ද ප්‍රතිඵලය උදෙසාය. මේ දක්වා මෙම ප්‍රශ්නයෙන් තාමත් තැලෙන්නේ ඒ අහිංසක ජනතාවය. ඉඩම් දුන්නේ සිංහල දේශපාලකයන්ය. ඉඩම් ගත්තේ මුස්ලිම් දේශපාලකයන්. එහෙත් අද තැලෙන්නේ එම ජනතාවය. එම තැලෙන ජනතාවේ තරුණ පරපුර අතරින් වෛරී සිතුවිලි පහළවී පළිගන්නට සිතන පරපුරක් බිහිවිය නොහැකි යයි කාට කිව හැකිද ?

ප්‍රභාකරන් ලා බිහිවූයේ ද එලෙසමය. ඔහු විමුක්ති කාමියෙක් ලෙස හංවඩු ගැසුනේ සිංහල ජාතියෙන් පලිගන්නටය.

එදා හැත්තෑව දශකයේ කයිට්ස් මන්ත්‍රීවරයාව සිටි නවරත්නම් මන්ත්‍රීවරයා දෙමළ ස්වයංපාලන පක්ෂය ලෙසින් පක්ෂයේ නිර්මාණය කළේය. ප්‍රභාකරන්ගේ අනුගාමිකයා ඔහුය. ඔහුගේ හිතේ රෝපණය වූ එම කුඩා පැලයට වතුර පොහොර දමා සාත්තු කළේ දෙමළ මෙන්ම සිංහල දේශපාලඥයන් ප්‍රභාකරන් ජාතිවාදියෙකු ලෙස හංවඩු ගැසූවද ඔහු මුලින්ම ඝාතනය කළේ තමන්ගේම එකෙකි. ඒ යාපනයේ පුරපතිව සිටි ඇල්ප්‍රඩ් දොරෙයිඅප්පා ය. ඒ මුල් සටන්වලට දෙමල එකස්ත් විමුක්ති පෙරමුණේ නායක අමිර්තලිංගම්ලාගේ වත්‍ර සහයෝගය පවා ඔවුන්ට ලැබිණි. එදා 83 ජූලි කලබල ඇතිවෙන විට එල්ටීටීය සිටියේ පූර්ණ කාලීන සාමාජකියින් 25 දෙනෙකු පමණි. 83 කෝළහලය තෙල් පෙට්‍රල් දමා ගිනිබත් කර එය පහළොස් දහස දක්වා වැඩිකර දුන්නේ අපියි. අපිට තර්ජනය කර අද දළු ලා උස් මහත් කරගත් මහ රුක කපා දැම්මේ අපිය. මේ වසර හය පුරාවටම අපි කළේ කුමක්ද . ඒ කපා දැමූ කඳ මත වාඩි වී සටන් පාඨ කියමින් සවිදිය පිරූ එක පමණි. ඒ ගසට යට වූ ප්‍රාණීන් ගැන සොයි බැලීමට කිසිවකුත් නැති කළට අපි කුමක් කරමුද ?

අද උතුරේ මෙන්ම දකුණේ ද රැකියා නැත. උගත් සිසුන් මහා පාරට බැස උද්ඝෝෂණය කරන්නේ තම අයිතිවාසිකම් මෙන්ම රැකියා ලබාගන්නටය. මේ දැවෙන ප්‍රශ්නවලට කිසිඳු විසඳුමක් ඉදිරිපත් කර නැත. රාජපක්ෂ පලවා හැර ජනතාව ඔවුන්ට බලය දුන්නේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට මිසක් ප්‍රශ්න ගැන කතාකරමින් සිටීමට නොවේ. යුද්ධයක් දිනාගත් රටක යුද්ධය මුලට දමා පාලකයන් වසර තිහක් ඇදගෙන ගියද, යුද්ධය අවසන් වූ වසර හය තුළ අප නිෂ්පාදනය කර ඇත්තේ වීරයන් පමණි. දැන් කරන්නේ රාජපක්ෂලා වීරයන් සමරන විට රනිල්ලා වීරයන් අමතක කරමින් තමන්ට එරෙහි වූ ද්‍රෝහියන් පසුපස යාමය. මෛත්‍රී කැඩුණු සිත් එක් කරන්නටත් අනෙක් පැත්තෙන් වෙහෙස දරයි. එහෙත් ඒ වෙනුවෙන් ඔහුට කළ හැක්කේ කුමක්ද ? වනක්කම් ආයුබෝවන් කීමෙන් ඒ දේ කළ හැකිද ? දෙමළ සිංහල හිත් බිඳුණේ අද ඊයේ සිට නොවේය. එයින් පුරාතන ඉතිහාසයක් ඇත. ඒ හිත් සුවපත් කිරීමට මෛත්‍රීට කිසිදා කළ නොහැකිය. එය සුවපත් කළ හැක්කේ මේ සිංහල දෙමළ දැවෙන ප්‍රශ්ණවලට විසඳුම් දීමෙන් පමණි. ඇති නැති පරිසරය බිඳ රැකියා සුලභ කොට ආර්ථිකය ශක්තිමත් කොට සංවර්ධනය කිරීමෙන් පමණි. අධිවේගී මාර්ගවලත්. අහස උසට නැගි ගොඩනැගිලිවලටත් ව්‍යාජ සිනාවට හෝ කතාවටත් එය කළ නොහැකිය. අපි දැන් කුමක් කරමුද ? ඒ එදා ලෙසම මෙම ප්‍රශ්ණය වවා කෑම පමණි. තවත් ප්‍රභාකරන්ලා, තව තවත් විජේවීරලා බිහිවනතෙක් තවත් සමූල ඝාතනයක් එනතුරු පාලකයන්ට දැන් කළ හැක්කේ එපමණකි.

යුද්ධයකට අතීතයක්, ඉතිහාසයක් ඇත. එහෙත් අනාගතයක් නැත. අනාගතය හිමි වන්නේ එම යුද්ධයේ නටබුන් පමණි. අනාගතය නිර්මණය කළ හැක්කේ එම නටබුන් මතින් උපන් ප්‍රශ්නවලට පිළියම් යෙදීමෙන් පමණි. අපිට අපේ විරුවන් සේම අනෙකාටද විරුවකු වීමේ අයිතියට අපි ගරු කළ යුතුය. සාමය තුළින් විරුවන් බිහිවන්නේ නැත. යුද්ධයක් දිනා ලබගත් සාමය තුළින් උපදින විරුවන් සැමරීමට කාටත් අයිතියක් තිබිය යුතුය. නන්දිකඩාල් කලපුවේත් විහාර මහාදේවී උයනේත් මාතර උයන්වත්තේ දැල්වෙන්නේ එකම පහනකි. මෛත්‍රීගේ, මහින්දගේ මෙන්ම විග්නේශ්වරන් අතේ දැල්වෙන්නේද එකම පහණකි. උතුරු නැගෙනහිර, දකුණ ලෙස මායිම් වෙන් කරගෙන සටන් කළද පහන් තැටියේ දැල්වෙන පහන් එළිය බෙදාගෙන වෙන් කර සටන් කිරීමට තාමත් බැරිය. ඒ පහන් එළියට සීමා මායිම් නැත. මෙම යුද්ධයෙන් බිහිවුණු ආබාධිතයන් අනාථයන් කොපමණද ඒ සැමට මෙම එළි යසඳ එළියක් සේ පිවිතුරු විය යුතුය. නැතිනම් සිදුවන්නේ, දෙමළ සිංහල මුස්ලිම් අප සැමටම අනාථවක් අසරණයන් ආබාධිතයන් සේ වෛරය හිතේ තද කරගෙන අනාගත පරපුර එය බාර දී සිත් තැවුලෙන් මිය යාමට පමණි.

---

# පොසොන් උදානය

පොසොන් මසෙහි පුන් පොහො දිනය        එළැඹුණා
මිහින් තලව සඳ කිරණින් මැ        නැහැවුණා
අනුබුදු මිහිඳු හිමි සිරිලකට        පැමිණුණා
බුදු ගුණ සුවඳ මගෙ රට තුළට        පිවිසුණා

ගොවිතැන් බතින් සරු වූ මගේ හෙළ        දෙරණ
තව එළිවුණා ලද විට සම්බුදු        කිරණ
මහරජ, මහ ඇමති පිළිගෙන බුදු        සරණ
බුදු දහමට ලබා දුන් ලොවෙහි මුල්        තැන

දහම් පණිවුඩය සහ මිහිඳු හිමි        ගෙනැ
සූසැට කලාව ද මගෙ රටට        පැමිණුණ
ජනතාවට නිවන් පුර දොරටු        හැර දෙන
දාගැබ්, මහ වෙහෙර මුළු රටෙහි        බිහිවුණ

කොඩිවැල් ලෙළෙන අනුරාපුරය        අද දින
සංකේතයකි බොදු දනහට සුවය        දෙන
තව දිගු කලක් මහබෝ සමිඳු        රැකගෙන
මිහිඳු හිමියනට පුද කරමු        කළගුණ

පොසොන් මසෙහි අප ලද මා හැඟි        දහම
අදඅ පි බෙදා දෙමු ලොවැ සතර        අතටම
අවිදු අඳුර දුරලා සිත් තුලික්        සැම
සසරින් මිදෙමු එය වෙයි නිසිබුදු        දහම

**සිරිවිමල මුතුකුමාරණ**



**කුලියට දීමට තිබේ**

ශ්‍රී ලාංකික මවක් ජීවත්වන පහසුකම් සහිත නිවසක කාමරයක් කෑම සහිතව නවාතැන් පහසුකම් දීමට Kings Park හි ඇත.

St Albans සහ Keilor Plain දුම්රිය ස්ථානයට විනාඩි 5 ක දුරකි.

**විමසීම් 0430 85 31 30**